# පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ

ඩබ්. ඩබ්. සසිකා දමයන්ති*

---

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ශ්‍රී ලංකාවේ අගනුවර වන අතර කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටි පුරාවිද්‍යාත්මක වටිනා කමින් වැඩිම ස්ථානය මෙන්ම සාහිත්‍ය ලොව තුළ ද ස්වර්ණමය නාමයක් දිනා ගත් නගරයක් ලෙස ද හැඳින්වීමට හැකිය. වර්තමානයේ ජනගහනය අධික වීම නිසා ගොඩනැඟිලි ඉතා විශාල ප්‍රමාණයක් ඉදිවෙමින් පවතින අතර එම ඉදිකිරීම් හේතුවෙන් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පුරාවිද්‍යාත්මක වටිනාකම අභාවයට යමින් තිබේ. අභාවයට යමින් තිබෙන එම ස්ථාන පිළිබඳ පුළුල් අධ්‍යයනයක් සිදුකිරීම මෙහි ප්‍රධානම අරමුණයි. ඒ සඳහා එම ස්ථාන එකිනෙක ගවේෂණය කළේය.

මෙම අධ්‍යයනය සඳහා මූලාශ්‍ර වූයේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පිළිබඳ ලියැවී ඇති පොත පත හා ජනප්‍රවාද යි. එහිදී පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථාන, නටබුන් මෙන්ම පුරාවිද්‍යාත්මක වටිනා කමින් යුත් බොහෝ දෑ පස් තුළ සැඟවී ඇති බව මෙම අධ්‍යයනයේදී අවබෝධ කරගත හැකි විය. තව ද විහාරාධිපති ස්වාමීන් වහන්සේලා සහ වැඩිහිටි ගම්වාසීන් කිහිපදෙනෙකු සමඟ සාකච්ඡා කිරීම ,මෙම අධ්‍යයනය සම්බන්ධයෙන් තොරතුරු රාශියක් දැන ගැනීමට හේතුවිය. අනුරාධපුර, පොළොන්නරු, ගම්පල ආදී පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථාන සංරක්ෂණය වේ. නමුදු ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ බල ප්‍රදේශ තුළ ඇති ඓතිහාසික ස්ථාන සංරක්ෂණයේ මඳ බවක් දක්නට ඇත. එහෙයින් සමහර පුරාවිද්‍යාත්මක ඓතිහාසික ස්ථාන නාමපුවරු වලට පමණක් සීමා වී ඇති අතර එම ස්ථාන මිනිසුන්ගේ කැළිකසල බහාලීමට, ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු මෙන්ම වාහන ගාල් කිරීමට අපූරු තෝතැන්නක් කරගෙන තිබේ. එහෙයින් දැනට පවතින ඓතිහාසික ස්ථාන රක්ෂණයට පියවර ගන්නේ නම් අනාගත පරපුරටත් අධ්‍යයනය කිරීමට හැකිවන අතර මේ පිළිබඳ අවධානය යොමුකර සංරක්ෂණ කටයුතු සිදු කරන්නේ නම් එදා පැවති තාක්ෂණය, කලාව ආදී තවත් බොහෝ පුරාවිද්‍යාත්මක කරුණු රාශියක් අනාවරණය කර ගත හැකි බව නිගමනයයි.

මුඛ්‍ය පද :- පුරාවිද්‍යාත්මක වටිනාකම , ඓතිහාසික , අධ්‍යයනය , ශ්‍රී ජයවර්ධනපුර , සංරක්ෂණය

* හින්දි භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය wdskumara862@gmail.com